**CEYLON HIGH SPEED RAILWAYS LIMITED**
PB 5257
*"Speed of Human Mobility"*

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,
ජනාධිපති කාර්යාලය,
කොළඹ-01
2018-05-10

ගරු ජනාධිපති තුමනි,

## විදුලි දුම්රිය නිෂ්පාදන ව්‍යාපෘතිය අනුමත කිරීම සඳහා කොමිස් මුදල් ලබා ගැනීමට තැත් කිරීම.

ජනාධිපති ලේකම් තුමා විසින් අපගේ ඉල්ලීම මත එවා ඇති 2017-09-24 දින හා 2017-10-24 දිනැති ලිපි වලට ප්‍රකාරව දක්වමින් තවමත් අනුමැතිය දීම ප්‍රමාද කර ඇති බව කණගාටුවෙන් දන්වමු.

1) 2016-10-28 වන දින අපගේ ආයෝජන ව්‍යාපෘති යෝජනාව ආයෝජන මණ්ඩලය වෙත යොමු කරන ලදී.
2) 2016-12-10 දින අපගේ ආයෝජකයින්ගේ ආයෝජන එකඟතා, ලිපි මගින් ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂක විදර්ශන ප්‍රනාන්දු මහතා වෙත යුරෝපයේ සිට විශේෂිත තැපැල් මගින් යොමු කරන ලදී.
3) එවකට සභාපතිව සිටි උපුල් ජයසූරිය මහතා විසින් අදල කටයුතු ඉදිරියට කරගෙන යෑම සඳහා කමිටුවක් පත් කිරීමට විදර්ශන ප්‍රනාන්දු මහතාට උපදෙස් ලබා දුන් බව අප හට දන්වන ලදී.
4) අධ්‍යක්ෂක ජනරාල් වරාය යටතේ ඇති අභ්‍යන්තර ව්‍යාපෘති ප්‍රේරණය කිරීමේ කමිටුවට යොමුකල අවස්ථාවේ ඔහු විසින් මෙවැනි ව්‍යාපෘතියක් ලංකාවට පැමිණෙන්නේ මන්ද,යි සෙවිය යුතු බව පවසමින් දින 60ක පමණ කාලයක් ගත කොට, පසුව ඔහු පැවසුවේ මෙම ව්‍යාපෘතියේ නියම ආයෝජකයන් කව්රුන්ද,යි සෙවිය යුතු බවත් අදල මුදල් තැන්පත් කර ඇති ගිණුම් ඔහුට පෞද්ගලිකව නිරීක්ෂණය කිරීමට අවශ්‍ය බවත්, ඒ සඳහා අවස්ථාව ඔහු හා ඔහුගේ නියෝජිතයන් හට මුල් අවස්ථාවේදීම අප විසින් අවශ්‍ය බලය පැවරූ ලිපි ඔවුන් හට ලබා දෙන ලෙසත්ය.
5) මෙම තත්වය එවකට සභාපතිව සිටි උපුල් ජයසූරිය මහතාට විදර්ශණ ප්‍රනාන්දු මහතා විසින් දැන්වූ විට ඔහු පවසා තිබුණේ හැකි විගස ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂක අනුමැතියට යොමු කරන ලෙස විදර්ශන මහතා හා ඔහුගේ කාර්ය මණ්ඩලයට නියෝග කල බව විදර්ශණ මහතා විසින් අපහට දන්වන ලදී.
6) සභාපතිවරයා මෙම නියෝගය දැනගත් විගස අධ්‍යක්ෂක ජනරාල් වරයා වූ දුමින්ද ආරියසිංහ මහතා පවසා ඇත්තේ සභාපතිවරයාගේ නොදැනුවත්කම නිසා මෙවැනි දේ පවසා ඇති බවත්, නිත්‍යානුකූලව ආයතනයේ වගකීම හා බලය ඇත්තේ ඔහු හට පමණක් බවත්, ඔහුගේ අනුමැතිය නොමැතිව අධ්‍යක්ෂක මණ්ඩල යෝජනා පත්‍රයක් සකස් නොකරන ලෙසටත්ය. මෙම අනුවණ ක්‍රියා මාර්ග නිසා තවත් සති කිහිපයක් ගත විය.

CEYLON HIGH SPEED RAILWAYS LIMITED
No : 605, Nugape,
Phone 0094112225641
Telefax 0094112225642
Chairman Mrs. Anushka Renu
Directors Mr. Nicles Srimal

7) මෙම කාලපරිච්ඡේදය ඇතුලත අපට දැනගැනීමට ලැබුණේ එවකට සිටි සභාපතිවරයා වූ උපුල් ජයසූරිය මහතා තම සේවයෙන් ඉල්ලා අස්වී ඇති බවය.

8) මෙම තත්වය අප විසින් අපගේ යුරෝපිය අධ්‍යක්ෂකවරයා වන ඉන්දික අනුරුද්ධ මහතා දැනුවත් කල පසු ඔහු විසින් කිප විටකම දුමින්ද ආරියසිංහ මහතාව දුරකථනයෙන් සම්බන්ධ කර ගැනීමට උත්සහ කරන ලද අතර එම කිසිම අවස්ථාවක ඔහු දුරකථනයට නොපැමිණි බවත් හා අනුමැතිය සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් නොගත් බවත්ය.

9) පසුව අප යුරෝපිය අධ්‍යක්ෂකවරයා වන ඉන්දික අනුරුද්ධ මහතා විසින් පාස්කර්ලිංගම් මහතා අපහසුවෙන් දුරකථන මාර්ගයෙන් සම්බන්ධ වී තත්වය පැවසු විට, ඔහු පවසා තිබුණේ අනුමැතිය දීමට ඔහු විසින් ආයෝජන ගිණුමක් ආරම්භකර දුන්විට මුළු ආයෝජනයෙන් 25%ක මුදල් ප්‍රමාණයක් ලංකාවට රැගෙන විත් තැන්පත් කරන ලෙසය.

10) මෙම ඉල්ලීමට අපගේ යුරෝපිය ආයෝජකයින් කිසිවිටක එකඟ වුයේ නැත. ඒ මන්ද එම මුදල සඳහා ලංකාවේ රජය විසින් කිසිම ආරක්ෂණයක් නොලැබෙන නිසාය.(investment protection)

11) අප විසින් කිප විටක ඉල්ලීම් කලද, අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ කාර්යාලයෙන් කිසිදු පිලිතුරක් නොලැබිණ. පසුව අප හට දැනගැනීමට ලැබුණේ මෙම ව්‍යාපෘතියට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය බවත්, එම කර්තව්‍ය කර ගැනීම සඳහා අදල අමාත්‍යාංශයේ ඇමතිවරයා වන මලික් සමරවික්‍රම මහතා පෞද්ගලිකව හමුවන ලෙසටය. පසුව ඔහුගේ පෞද්ගලික නියෝජිතයෙක් අප හා සමග දුරකථනය මගින් සාකච්ඡා කරන ලදී. එම සියලු හඩ පට අප ලඟ සුරක්ෂිතව ඇත.

12) පසුව කඩිමුඩියේම දිනකට පෙර අප ආයතනයේ අධ්‍යක්ෂක වරයකුට අග්‍රාමාත්‍ය කාර්යාලයට පැමිණෙන ලෙස දැනුම් දෙන ලදී. අප ඉතා කඩිනමින් එම රැස්වීම සඳහා සහභාගි වීමට ගිය විට අපට දැන ගැනීමට ලැබුණේ එය 'windows commitee' යන බවය. එම කොමිටියේදී දුමින්ද ආරියසිංහ මහතා අප හට පවසා සිටියේ මෙම ව්‍යාපෘතිය තේරුම් ගැනීමට නොහැකි බවත්, මෙවැනි විශාල ව්‍යාපෘති ලංකාවට මීට පෙර පැමිණ නොමැති බවත්, මෙවැනි ව්‍යාපෘතියක් අනුමත කිරීමට ආයෝජන මණ්ඩලයට කිසිම පලපුරුද්දක් නොමැති බවත්ය. පසුව ඔහු පවසා සිටියේ, ඔහුට මෙම ව්‍යාපෘතියේ යුරෝපිය ආයෝජකයන් පෞද්ගලිකව හමුවිය යුතු බවත්, ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති මුදල් තැන්පත් කර ඇත්තේ කුමන බැංකුවලද යන්නත් ඔහුහට දැනගැනීමට අවශ්‍ය බවත් හා නැතිනම් මෙම ව්‍යාපෘතිය ප්‍රතික්ෂේප කරන බවත්ය. අප අධ්‍යක්ෂක වරයාගේ වැඩිදුර පැහැදිලි කිරීමෙන් පසු එම කොමිටියේ සිටි මුදල් අමාත්‍යාංශයේ ආචාර්ය R.H.S. සමරතුංග මහතාගේ මැදිහත් වීමෙන් මෙවැනි ව්‍යාපෘති ලංකාවට අවශ්‍ය බව සඳහන් කරන ලදී. පසුව කමිටුව තීරණය කලේ තවත් දිනයක අවශ්‍ය ලියකිවිලි සමග මෙම ව්‍යාපෘති අනුමැතිය සඳහා කැදවන බවයි.

13) විදර්ශන මහතාගේ මැදිහත් වීම මගින් මෙම ව්‍යාපෘතිය කරගෙන යාමට උත්සහ දරණ බව දැන ගැනීමට ලැබීමෙන් පසු දුමින්ද ආරියසිංහ මහතා විසින් ඔහුව ආයතනයේ වෙනත් සුළු ආයතනික කරුණක් මුල් කරගෙන සේවය තාවකාලිකව අත්හිටුවා අපගේ ව්‍යාපෘතිය ඔහු තනි පාලනයට ලබා ගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා වෙනත් අධ්‍යක්ෂකවරු සිටියදී ඔහු විසින් පෞද්ගලිකවම ඔහුගේ යටතට ලබා ගන්නා ලදී.


CEYLON HIGH SPEED RAILWAYS LIMITED
No : 605, Nugape,
Pamunugama, 31170
Colombo. Sri Lanka.

Phone 0094112225641
Telefax 0094112225642
E-mail infor@chsrltd.com
Web www.chsrltd.com

Chairman Mrs. Anushka Renu
Directors Mr. Nicles Srimal
Mr. Anton Deshapriya
Mr. Chanaka Amith

14) සති කිහිපයකට පසු අපහට දැනගැනිමට ලැබුණේ ඔහු හා මහින්ද රාමනායක මහතා ඉතාලියේ සංචාරයක් කිරීම සඳහා යන බවත්, ඒම සංචාරයේදී අප යුරෝපිය අධ්‍යක්ෂකවරයා හමුවීමට හැකි බවත් එමගින් අපගේ ආයෝජකයන් ඉතාලියේදී හමුවීමට හැකි බවත්ය.

15) මිලාන් සෙන්ට්‍රල් ස්ටේෂන් එක අසල පිහිටි හෝටලයේදී 2017-09-28 දින අප අධ්‍යක්ෂක දුමින්ද ආරියසිංහ මහතා හා මහින්ද රාමනායක මහතා හමුවිය. එහිදී දුමින්ද ආරියසිංහ මහතා පවසා සිටියේ මෙම ව්‍යාපෘතිය අනුමත කර ගැනිමට අවශ්‍ය නම් මහින්ද රාමනායක මහතා පමණක් පවසන ආකාරයට කටයුතු කරන බව හා නැවත සියලුම ලිපි ලේඛණ අලුතින් ඔහු හට ලබා දෙන මෙන්ය. එසේ නොවන්නේ නම් ඔවුන් හට මෙම ව්‍යාපෘතිය අනුමත කිරීමට නොහැකි බවය. තවද මෙම හමුවීම කිසිවෙකුට නොදන්වන ලෙසද පවසන ලදී. තවත් කරුණක් වුයේ කිසි විටෙක මෙම ව්‍යාපෘතිය ගැන සාමාන්‍ය දුරකථනයෙන් කථා නොකරන ලෙසය.

16) දින කිහිපයකට පසු මහින්ද රාමනායක මහතා අප යුරෝපිය අධ්‍යක්ෂකවරයා අමතා පවසා තිබුණේ නොබෝ දිනකින් රාජ්‍ය ඇමතිතුමා වන සුජිව සේරසිංහ හට අපගේ ආයෝජකයන් කෙලින්ම හා පුද්ගලිකව හමුවීමට අවශ්‍ය බවයි. පසුව එම ඉල්ලීම අනුව අප විසින් 2017-10-17 දින මිලානෝ නගරයේදී අදල හමුවීම සුදනම් කරන ලදී.youtube වීඩියෝ පට බලන්න. https://www.youtube.com/watch?v=lg68iXNPr3U

17) මෙම අමාත්‍ය හමුවීමේදී ඔහු විසින් අප ආයෝජකයන් සමඟ සකච්ජා කොට ලංකාවේ ඉඩම් ලබා ගැනිම ඉතා දුෂ්කර බවත් නමුත් ඔහුහට එම ප්‍රශ්ණය විසඳිය නොහැකි බවත්ය. එම අවස්ථාවේදීම අපගේ ඉතා උසස් ආයෝජකයන්ට පවසා සිටියේ ඔහු කිසිදිනක හොරකම් නොකරන බවත් ඔහු smart පුද්ගලයකු බවත්ය. youtube දර්ශණ බලන්න. https://www.youtube.com/watch?v=uRhYRh4kCkE

18) ඉතා වැදගත් කරුණක් නම් එම අවස්ථාවේදීම සුජිව සේරසිංහ ඇමතිතුමාගේ පෞද්ගලික යහළුවෙක් වන ඉතාලියේ ජිවත්වන දිලිප් වෙදමානික්කම් මහතාව අපගේ ආයෝජකයන්ට හඳුන්වාදෙන ලදී. ඔහු පවසා සිටියේ ඔහු මගින් අමාත්‍යවරයාව කෙලින්ම සම්බන්ධ කර ගත හැකි බවත්ය. තවද මෙම හමුවීමට ලංකාවේ තානාපතිතුමාද පැමිණ සිටියත් ඔහුව මඟ හැර මෙම සාකච්ජාව කිරීමට අමාත්‍යවරයා උපදෙස් දෙන ලදී.

19) තවත් දින කිහිපයකට පසු අමාත්‍යවරයාගේ නියෝජිතයා අප ආයෝජකයන් අමතා පෞද්ගලිකව හමුවීමට අවශ්‍ය බව පවසා ඇත. එවිට අප ආයෝජකයන් පවසා ඇත්තේ Ceylon highspeed railways සමාගම සමග රැස්වීම සැලසුම් කල යුතු බවයි.

20) තවත් දින කිහිපයකට පසු ආයෝජන මණ්ඩලයේ විරාන් ප්‍රනාන්දු මහතා නැවතත් අප අමතා 'windows commitee' යට පැමිණෙන ලෙස දන්වන ලදී. එහිදී ආයෝජන මණ්ඩලයේ සභාපති හා දුමින්ද ආරියසිංහගේ ඉල්ලිම වුයේ අපගේ සම්පුර්ණ ව්‍යාපෘති සැලසුම (business plan) සහ ගැනුම්කරුවන්ගේ, සැපයුම් කරුවන්ගේ, ලබන්නාවු ලාභ හා අනෙකුත් තාක්ෂණික හැකියාවන් පිලිබඳව සියලු රහස්‍ය විස්තර ඔහු හට ලබා දෙන ලෙසය. ඉතාමත් පුදුම සහගත කරුණක් වුයේ අප කර්මාණ්තපුර වල පාරවල් හා යටිතල පහසුකම් වලට අප පෞද්ගලිකව වියදම් කිරීමට බලාපොරොත්තු වන්නාවු වියදම් හා අනෙකුත් විස්තර ඔවුන් හට ලබා දිය යුතු බවය.

Anushka

**CEYLON HIGH SPEED RAILWAYS LIMITED**
No : 605, Nugape,
Pamunugama, 31170
Colombo. Sri Lanka.

Phone 0094112225641
Telefax 0094112225642
E-mail infor@chsrltd.com
Web www.chsrltd.com

Chairman Mrs. Anushka Renu
Directors Mr. Nicles Srimal
Mr. Anton Deshapriya
Mr. Chanaka Amith

21) මෙම සාකච්ඡාවේදී අප හට දුමින්ද ආරියසිංහ පවසා සිටියේ මෙම ව්‍යාපෘතිය කලත් නොකලත් ඔවුන් හට වැටුප් මුදල ලැබෙන බවය. තවත් කරුණක් ලෙස දුමින්ද ආරියසිංහ මහතා හා සභාපතිවරයා සිවේ ආයෝජන මණ්ඩලයට පැමිණෙන ආයෝජකයින්ට අවශ්‍ය පහසුකම් ලබා දෙනවා මිස නව ආයෝජකයන් සොයා යැමට කිසිම උවමනාවක් ඔවුන් හට අවශ්‍ය නොවන බවය. ඉහත සියලු සාකච්ඡා අපගේ හඬ පටවල ඉතා පැහැදිලිව සටහන් වී ඇත.

22) ආචාර්ය සමරතුංග මහතාගේ(මුදල් අමාත්‍යාංශයේ ලේකම්) ඉල්ලීම මත ආයෝජන මණ්ඩලය මගින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අපගේ ව්‍යාපෘතියේ ආයෝජකයන්ගේ සත්‍යතාවය හා සක්‍යතාවය රහසිගතව විමසන ලදී. එම වාර්තාව ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සෝමසේන මහතා විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය හාරේ ආයෝජන මණ්ඩලයට යවා එම වාර්තාව තවමත් යට ගසා සිටිමින් අප ව්‍යාපෘතිය ඉතා සැලසුම් සහගතව විවිධ අනවශ්‍ය විස්තර විමසමින් ප්‍රමාද කරමින් සිටියි.

23) මෙසේ වීමට ප්‍රධාන හේතුව වනුයේ මලික් සමරවික්‍රම හා සුජිව සේරසිංහ ඇමතිවරුන්හට ඔවුන්ගේ ඉල්ලීම පරිදි අප හා අපගේ ආයෝජකයන්ගේ කොමිස් මුදල් හා සමාගමේ කොටස්, මුල් අවස්ථාවේදී ලබා දීමට එකඟ නොවීම නිසා ඔවුන්ගේ දූෂිත වැඩ කටයුතු සඳහා ආයෝජන මණ්ඩලයේ සිටින ඔවුන්ගේ හිතරු ගෝලයන් වන දුමින්ද රත්නායක යන තමන්ගේ රැකියා පුටුව රැකගැනීම සඳහා ඇමතිවරුන්ගේ දූෂිත ක්‍රියාවලට සහයෝගය දෙන මෙම වංචනික ගෝලයන් යොදා ගනිමින් පවත්වා ගෙන යනු ලබන ආයතනික දේශපාලන මාෆියාවක් බව අපගේ හැගීමයි.

24) මෙම තත්වය පිලිබඳ අදල අමාත්‍යාංශයේ ලේකම්වරයා වන වාන්දනී විජේවර්ධන මහත්මියට යුරෝපියේ සිට දුරකථනයෙන් දන්වා සිටි අතර එය පිලිබඳ එතුමියට කිසදු ක්‍රියා මාර්ගයක් ගැනීමට නොහැකි වන ලෙස මලික් සමරවික්‍රම මහතා පවසා ඇත්තේ අපගේ ව්‍යාපෘතිය පිලිබඳව සියලු කටයුතු මලික් සමරවික්‍රම විසින් සිදු කරන බවය. විශේෂයෙන් මෙම ව්‍යාපෘතියට ලේකම්තුමියට අත නොගසන ලෙස පවසා ඇති බව අප හට දැන ගැනීමට ලැබිණි.

අප ශ්‍රී ලංකාවට ඉතාමත් වැදගත් සෘජු රැකියා අවස්ථා 22500 කට ආසන්න ප්‍රමාණයක් සලසමින් සෘජු වාර්ෂික යුරෝ බිලියන 5කට වැඩි අඛණ්ඩ විදේශ අපනයන ආදායමක් රටට ලැබීමට සලස්වමින් ඉතාමත් පරිසර හිතකාමී ක්‍රමයන් යටතේ ඇමරිකන් ඩොලර් මිලියන 500ක විදේශ ආයෝජනයකින් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති මෙම ව්‍යාපෘතිය වසර දෙකකට ආසන්න කාලයක් කොමිස් මුදල් හා ව්‍යාපාර කොටස් මුදල් ලබා ගැනීමේ චේතනාවෙන් ප්‍රමාද කිරීම පිලිබඳව අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් ස්වාධීන පරීක්ෂණයක් කොට මෙවැනි ඉතා රටට වැදගත් වූ ව්‍යාපෘති රැකදෙනමෙන් ඉතා කරුණිකව ඉල්ලා සිටින අතර තවත් වැදගත් කරුණක් ලෙස දන්වා සිටිය යුත්තේ මලික් සමරවික්‍රම හා සුජිව සේරසිංහ ඇමතිවරුන්ගේ පෞද්ගලික අපේක්ෂාවන් ක්‍රියාත්මක කිරීම පිණිස ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන තනතුරක් වන අධ්‍යක්ෂක ජනරාල් තනතුරට පත්කර ඇති දුමින්ද ආරියසිංහ මහතා රටේ සුභසිද්ධිය සඳහා ක්‍රියා කරනවා වෙනුවට මලික් සමරවික්‍රම හා සුජිව සේරසිංහ මහතාගේ පෞද්ගලික ප්‍රතිලාභ සඳහා ආයෝජන මණ්ඩලයේ සිට වැටුප් වශයෙන් රජයේ මුදල් ලබා ගෙන

කරන්නාවූ මෙම විනාශය මහජන දේපල අවභාවිතය කිරීම හා රටේ සංවර්ධනය මුලුමනින්ම නවතා දැමීමට මොවුන් කරන්නාවූ සෘජු ක්‍රියා මාර්ගයකි.

සෝචනියම කරුණ වනුයේ මොවුන්ගේ මෙම මාෆියාවට විරුද්ධව එම ආයතනයේම සේවය කල විදර්ශණ ප්‍රනාන්දු වැනි නීතිගරුක අධ්‍යක්ෂකවරයකුව ආයතනික චෝදනාවක් නොවූ ව්‍යාජ හේතුවක් දක්වමින් ක්ෂණයකින් සේවයෙන් නෙරපා දැමීමයි. මෙම කරුණු සියල්ල විමර්ශනය කර ඒ සඳහා අමාත්‍යාංශය හා ආයෝජන මණ්ඩලය අතර ඇති මෙම සැඟවුණු මාෆියාව පිලිබඳ ඔබතුමාගේ ස්වාධීන අවධානය යොමු කොට එම දූෂිත තත්වය නතර කිරීම සඳහා කඩිනමින් පියවර ගන්නා ලෙස ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

තවද ආයෝජන මණ්ඩලය සමඟ අදල අමාත්‍යාංශයේ මෙවැනි ක්‍රියාවන් දිගින් දිගටම සිදුවීමෙන් වන්නේ ගරු ජනාධිපතිතුමාගේ පරමාර්ථය වන (සංවර්ධනය), නව රැකියා උත්පාදනය, විදේශ අපනයන ආදයම ඉහල නැංවීම, නවතාක්ෂණය රටතුලට ගලා ඒම, සහ දැනුම පදනම් කර ගත් ආර්ථිකය රටාවක් රට තුල උදාකිරීම යන අති උත්තරීතර පැතුම අහසේ සුදු වලාකුළු වල පය තබා ඇවිදිමට උත්සහ දරන්නක් විමයි.

තවත් වැදගත් කරුණක් වන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ඉතාලි තානාධිපති කාර්යාලය මගින් මෙම ව්‍යාපෘතියේ අයෝජකයින්ගේ සත්‍යතාව පිළිබඳ කල විමර්ශන වාර්තාව ඔබතුමා ගෙන්වා නිරීක්ෂණය කර දැනුවත් වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

අවසාන වශයෙන් අප හා අපගේ විදෙස් ආයෝජකයින් ඔබතුමාගෙන් ඉල්ලා සිටියේ ඉහත කරුණු සියල්ල සලකා බලා මෙම ව්‍යාපෘතිය රට තුල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම සලසා දෙන ලෙසයි.

ස්තුතියි

මීට

Mrs. Anushka Renu
Chairman
CEYLON HIGH SPEED RAILWAYS LIMITED
No. 605, Nagape, Pamunugama, Sri Lanka.
Tel. 0094(0)112225641 Fax. 0094(0)112225642
Mobile. 0094(0)777770518
E-mail. anushka@chsrltd.com / Web. www.chsrltd.com

..............................

1. මෙම ව්‍යාපෘතිය සඳහා දැනටමත් මිලදීගෙන ඇති යන්ත්‍ර උපකරණ වල ඡායාරූප පහත අමුණා ඇත.
2. මෙම ව්‍යාපෘතියට ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන සෘජු ආයෝජකයින්ගේ ආයෝජන එකඟතා ලිපි විශේෂ තැපැල් මගින් වසර එක හමාරකට පෙර ආයෝජන මණ්ඩලයට එවන ලදි. එම ලිපි වල පිටපත් පහත අමුණා ඇත.